# ශ්‍රී ලංකාවේ පරිසර වාර්තාව නව සහස්‍ර තත්ත්වය කරා යොමුකිරීමේ සාධනීය පියවරක්



ඡායාරූපය : තාමිම හඳුරංග

"පරිසරයේ සොඳුරු නිමේෂයක්" - බුන්දල.

## ◆ ප්‍රශ්ණ පිළිබඳ අවධානය

සංවර්ධනය වෙමින් පවත්නා වෙනත් බොහෝ රටවල් සේම, ශ්‍රී ලංකාවද, සමාජ ආර්ථික සංවර්ධනයේත්, පාරිසරික සංරක්‍ෂණයේත්, එකිනෙකට ප්‍රතිවිරුද්ධ වූ වුමනාවන් සපුරාලීමේ ප්‍රශ්ණයට මුහුණ දී සිටියි. ජාතික මට්ටමින් මෙන්ම, ගෝලීය මට්ටමින්ද මතුවන්නා වූ විවිධ අභියෝගයන්ට මුහුණ දීමටත් එතුළින් ජාතියේ ආර්ථික වර්ධනයේ උත්තේජනයක් ඇති කර ගැනීමටත් අප රටේ සංවර්ධන රටාව පසුගිය දශක කීපය තුළ වෙනස් වෙමින් පැවතී ඇත. එනම් කෘෂිකර්මය මුල් කොටගත් ආර්ථිකයකින් කර්මාන්ත පදනම් කොට ගත් ආර්ථිකයක් කරා යොමු වෙමින් පැවතී ඇත. ඉතිරිකිරීම්, විදේශ ආයෝජන සහ අපනයනයන් ප්‍රවර්ධනය කිරීමට හිතකර වූ ප්‍රතිපත්තීන් අනුගමනය කෙරෙන වාතාවරණයක් තුළ, පෞද්ගලික අංශයේ ආර්ථික ක්‍රියාකාරකම් වලට ඉඩ පහසුකම් සැළසීම තුළින් කාර්මීකරණය ළඟාකර ගැනීමට සැළසුම් කෙරේ. කෙසේ නමුත්, මෙම ක්‍රියා වලිය තුළදී අපගේ ස්වභාවික සම්පත් වලට හා සමස්තයක් වශයෙන් අප රටේ පරිසරයට මෙම සංවර්ධන ක්‍රියාදමය තුළින් මතුකෙරෙන දීර්ඝ කාලීන බලපෑම් කෙරෙහි අප රට ප්‍රමාණවත් තරම් අවධානයක් යොමු කොට නොමැත. මීට අමතරව, අප රටේ ජනගහනයෙන් අඩු තරමින් 30%ක් තරම් වූ පිරිසක්වත් දරිද්‍රතාව තුළ දිවිගෙවීමත් ඔවුන්ගේ පැවැත්ම සඳහා ඔවුන් වැඩි වශයෙන් ස්වාභාවික සම්පත් මත යැපීමත් හේතුකොටගෙන පරිසරය ආරක්‍ෂාකර ගැනීමේ කාර්‍ය්‍ය බලාපොරොත්තු වන තරමට වඩා අසීරු වූත් සංකීර්ණ වූත් කටයුත්තක් බවට පත්ව ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස, පස, ඛණිජ සම්පත්, ජලය හා වාතය ඇතුළු අප රටේ ස්වභාවික සම්පත් සහ වනාන්තර, තණ බිම්, තෙත් බිම්, කඩොලාන, වගුරු බිම් හා කොරල් පර වැනි අපගේ පරිසර පද්ධතීන් පෙර නොවූ විරූ අන්දමේ පීඩනයට ලක්වී ඇත. මෙම තත්ත්වය දිගින් දිගටම පැවතීමට ඉඩහල හොත්, අවසානයේදී අප රටේ සංවර්ධන ක්‍රියාවලිය දීර්ඝ කාලීන වශයෙන් මුළුමනින්ම අඩපන වීමට ඉඩ ඇත.

විසිවන සියවසේ මැද භාගය වන තුරු අප රටේ භූමිය මුළු මනින්ම පාහේ ස්වභාවික වනාන්තර වලින් ආවරණය වී පැවතින. ඉන් පසුව, ස්වභාවික වන ගහනයේ ආවෘත වන වියන (Close Canopy) සීඝ්‍රයෙන් ක්‍ෂය වී ගොස් 1992 දී එය 24% කටත් වඩා අඩු ප්‍රමාණයක් දක්වා පහත වැටී ඇත. මෙය පාරිසරික ස්ථායීතාව පවත්වා ගැනීම සඳහා අවශ්‍ය කෙරෙන අවම ප්‍රමාණයටත් වඩා අඩු වනගහනයක් ලෙස සළකනු ලැබේ. ආන්තික භූමි සහ ප්‍රපාත සහිත කඳු බෑවුම් අධික ලෙස පරිහරණයට ගැනීමේ ප්‍රතිඵල වශයෙන්, ඒකීය තත්ත්වයක් පැවති ස්වභාවික



පද්ධතීන් අස්ථාවරත්වයට පත්ව ඇත. නිතර නිතරම පාහේ නාය යෑම් හට ගැනීමත්, ඒවා වඩාත් දැඩි ස්වභාවයකින් සිදුවීමත්, මෑත කාලයේදී දකිය හැකි වී ඇත. තවද, පසෙහි සරු බව හීනවීමත් ලවනීකරණය වීම සහ ජලය රැඳී පැවතීමත් අධික ලෙස සිදුවී ඇති බවට වාර්තා ලැබී ඇත.

කඩොලාන පද්ධතීන් සහ කොරල් පර විශාල ලෙස විනාශ කරනු ලැබීම මත්ස්‍යයන්ගේ සහ අනෙකුත් ජලජ ජීවන චක්‍රයන් කෙරෙහි අහිතකර ලෙස බලපා ඇති අතර, ඔවුන්ගේ සත්ව ගහනයන් දැඩි ලෙස හීන කිරීමට ද හේතු වී ඇත. කොරල් පරවලට සිදුකෙරෙන හානිය වෙරළාශ්‍රිත සමුද්‍රඛාදනය පිළිබඳ ගැටළු වඩාත් උත්සන්න කර ඇත. කර්මාන්ත සංවර්ධනය එහි පසුගාමී ක්‍රියාකාරීත්වයන් හරහා වාතය, ජලය හා පස දූෂණය කිරීමේ සාධක සපයා ඇත. මෝටර් වාහන වලින් පිටකෙරෙන විමෝචනයන් නාගරික ප්‍රදේශ වල වායු දූෂණය ඇති කෙරෙන ප්‍රධාන හේතුකාරකයකි. සමස්තයක් වශයෙන් පරිසරයේ තත්ත්වයට, ඵලදයීතාවට සහ තිරසාර පැවැත්මට එල්ලවන්නා වූ මෙකී බොහෝ වූ තර්ජන බියජනක නොවේනම්, ඒකාන්තයෙන්ම බරපතල වන්නේය.


***"පරිසරයේ ඵලදයී කළමනාකරණය සඳහා ක්‍රමෝපායයන් හා වැඩසටහන් සම්පාදනය කිරීමේ ක්‍රියාදාමයේ එක් ප්‍රමුඛතාවක් වන, නිරවුල් පාරිසරික දත්ත මූලයක් සැකසීම කෙරෙහි යොමු කෙරෙන සැළකිල්ල අතින් ගත් කල ජාතික පාරිසරික තත්ත්ව වාර්තාව අප රටට අතිශයින් වැදගත් වෙයි."***

### ◆ වැදගත් මූලාරම්භයක්

නිදහසින් පසුව බලයට පත් වූ රජයයන් මෙකී ගැටළු කෙරෙහි සැළකිල්ල යොමු කොට ඇති අතර, එම රජයයන් විසින් හඳුන්වා දෙනු ලැබුවා වූ පුළුල් වලංගුතාව සහිත පිතිපත්තීන් හා නීති පද්ධතීන් තුළින් මෙම තත්ත්වය නිවරැදි කර ගැනීමේ කීයා මාර්ගයනට මග පෑදී ඇත. කෙසේ වෙතත් අතීතයේ දී කීයාත්මක කෙරුණු සැලසුම් හා වැඩසටහන් තුළින් අත්කර ගත හැකි වී ඇත්තේ සීමිත සාර්ථකත්වයක් බව දනට ඇති සාක්ෂි වලින් පෙන්නුම් කෙරේ. සම්පත් සංරක්ෂණය කිරීමෙන් තොරව සිදු කෙරෙන සංවර්ධනය ස්ථිරසාරව පවත්වාගත හැකි සංවර්ධනයක් විය නොහැකිවාක් මෙන්ම එවැනි සංවර්ධනයක් ජීවන තත්ත්වය නංවා ලීමට ද ඉවහල් නොවන්නේය. එබැවින් අද අපට අවශ්‍යව ඇත්තේ වැඩි දියුණු කළ සහ ඒකාග්‍රතාවයෙන් යුත් ප්‍රතිපත්තීන්ගේ පිටුබලය සහිත, තිරසාර සංවර්ධනය සඳහා වන නොසැලෙස දේශපාලනමය කැපවීමකි.

පාරිසරික සංරක්ෂණයෙහි දී සාකල්‍ය ප්‍රවේශයක් උපයෝගී කර ගැනීමේ අවශ්‍යතාව හඳුනා ගන්නා ලදුව, මෙම අමාත්‍යාංශය විසින් හිතකර වූ වටාපිටාවන් සපයාදීමට, ජනගහනය සහ සම්පත් අතර සමබරතාවයක් පවත්වා ගැනීමට සහ ධරනීය ආකාරයකින් පරිසර භාවිතයට ගැනීමට ඉවහල් වන්නා වූ පරිසරාශ්‍රිත ප්‍රතිපත්තීන්, නීති රීති, ක්‍රමෝපායන් සහ සැළසුම් සම්පාදනය කරනු ලැබ ඇත. එලෙස ගනු ලැබූ මූලාරම්භක පියවර අතර වඩාත් වැදගත් පිළිවෙත් වනුයේ, ජාතික පාරිසරික ක්‍රියාකාරී සැළැස්ම, තෙත් බිම් සංරක්ෂණ සැලැස්ම, ජෛව විවිධත්ව සංරක්ෂණ ක්‍රමෝපායන්, වෙරළාශ්‍රිත - 2000, පිවිතුරු වාතය - 2000 සහ දේශගුණික වෙනස්වීම් පිළිබඳ ක්‍රියාකාරී සැළැස්මය.

පරිසරය, සුරැකීමේ හා කළමනාකරණය කිරීමේ විවිධ අංශ සම්බන්ධයෙන් අදළ වන්නා වූ නීතිමය අණ පනත් කීපයක් ද ලංකාවේ ක්‍රියාත්මකව පවතියි. බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියා පිළිවෙතක් හඳුන්වා දීමටත් සංවර්ධන ව්‍යාපෘති සඳහා පාරිසරික බලපෑම් ඇගයීමේ ක්‍රියා පිළිවෙතක් හඳුන්වා දීමටත් මෙන්ම සංවර්ධන ව්‍යාපෘති සඳහා පාරිසරික බලපෑම් ඇගයීමේ ක්‍රියා පිළිවෙතට නීතිමය පිටුබලයක් ලබා දීම පිණිසත් 1988 වර්ෂයේ දී සංශෝධනය කරනු ලැබුවා වූ ජාතික පාරිසරික පනත එවැනි එක් නෛතික ලියවිල්ලකි. කෙසේ වෙතත්, රට තුළ සිදුවෙමින් පවත්නා වත්මන් සංවර්ධනය විෂයය කොට ගත් කල, මෙම සංවර්ධනය විසින්ම මතුකරනු ලැබ ඇත්තා වූ පාරිසරික අභියෝගයන් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට මෙකී බොහෝ නීති ප්‍රමාණවත් නොවන බව යලි යලිත් ඔප්පු වී ඇත.



### ◆ 21 වන න්‍යාය පත්‍රය සහ පරිසර තත්ත්ව වාර්තාකරණය

පරිසර ක්ෂෙත්‍රය තුළ මෑත කාලයේ ගෝලීය මට්ටමින් සිදු වූ අති ප්‍රබල සිදුවීම වූයේ, 1992 ජූනි මාසයේ රියෝ ද ජැනෙයිරෝ නුවර පැවැත්වුනු එක්සත් ජාතීන්ගේ පරිසරය හා සංවර්ධනය පිළිබඳ සමුළුව (UNCED) ය. මෙතෙක් පවත්වා ඇති විශාලම සහ ජාතික නායකයින්ගේ අති ප්‍රබල ජාත්‍යන්තර හමුව ලෙස සැළකිය හැකි මෙම සමුළුව මහින්, පරිච්ඡේද 40කට අධික සංඛ්‍යාවක් ආවරණය කෙරෙමින් සම්පාදිත 21 වන න්‍යාය පත්‍රයෙන්, 21 වන සියවස සඳහා ප්‍රධානතම උපාය මාර්ගික දැක්මක් නිර්මාණය කෙරිනි. එහි එක් එක් පරිච්ඡේදය පරිසරය හා සංවර්ධනය යන තේමාවට අදල වන්නා වූ විශේෂිත අංශයක් වෙනුවෙන් මිඩංගුකොට ඇත. මෙම ලියවිල්ලේ පූර්විකාවෙහි සඳහන් කර ඇති අන්දමට, 21 වන න්‍යාය පත්‍රය, පවත්නා පීඩාකාරී ගැටළු කෙරෙහි සැළකිල්ල යොමු කරන අතරම, 21 වන සියවසේ අභියෝගයන් සඳහා ලෝකය සූදානම් කිරීම ද ඉලක්ක කොට ගනී. සංවර්ධනය සහ පාරිසරික සහයෝගීතාව පිළිබඳව ඉහළම මට්ටමින් ඇති කෙරෙන ගෝලීය ඒකමතිකතාවයක් හා දේශපාලනමය කැපවීමක් එමගින් පිළිබිඹු කරයි.

තිරසාර සංවර්ධනය අරභයා තීරණ ගැනීමේ දී අවශ්‍ය වන්නා වූ තොරතුරු ලබාගැනීමට ඇති ඉඩකඩ වැඩිදියුණු කිරීමේ වැදගත්කම, 21 වන න්‍යාය පත්‍රයේ 'තීරණ ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු' යන මැයෙන් වූ එහි 40 වන පරිච්ඡේදයේ හුවා දක්වයි. ස්වභාවික පරිසර පද්ධතිය බාදනයට ලක්වීම පිළිබඳව මෙන්ම මානව පරිසර පද්ධතිය පරිහානියට පත්වීම පිළිබඳවත්, ඒවායේ හේතුකාරකයන් සහ ආදීනව පිළිබඳවත් අවබෝධ කර ගැනීමේ දී වැඩි දැනුවත්භාවයක් තිබිය යුතු බව, ගෝලීය වශයෙන් මෙමගින් ප්‍රත්‍යක්ෂ වෙයි. ජාතික, කලාපීය හා ගෝලීය මට්ටම් වලින් පරිසරය පිළිබඳ තත්ත්වය (SE) කලින් කලට විධිමත්ව ඇගයීමට ලක්කිරීමේ දැඩි අවශ්‍යතාව මෙම නව සංශ්ලේෂණය මහින් අවධාරණය කෙරේ. ජෛව - භෞතීය සහ සමාජ ආර්ථික යන දෘෂ්ටි කෝණයන් දෙකකින්, රටක් පවතින්නා වූ තත්ත්වයන් විමසුමට ලක්කෙරෙන නියමාකාර පරිසර තත්ත්ව වාර්තාකරණයක් තුළින් මෙය සාක්ෂාත් කරගත හැකිය. තවද ප්‍රතිපත්තිමය මූලාරම්භයන්, නෛතික ප්‍රතිසංස්කරණයන් හා මහජන වයඝාවන් හි සිදුවන්නා වූ වෙනස්වීම් වැනි ප්‍රතිචාරයන්හි ප්‍රතිඵල පිළිබඳ සමස්තාවලෝකනයක් ද එමගින් සැපයේ.

### ◆ පරිසරයේ තත්ත්වය පිළිබඳ වාර්තාව සකස් කිරීමේ අරමුණු තුනක් ඇත.

i. සියළු මට්ටම්වල තීරණ ගැනීමේ ක්‍රියා වලිය වැඩිදියුණු කිරීම සඳහා පදනමක් සපයා දීම.

ii. පාරිසරික ප්‍රවනතාවයන් සහ තත්ත්වයන් පිළිබඳ දැනුවත් භාවය සහ අවබෝධය වර්ධනය කිරීම

iii. තිරසාරත්වය වෙත යොමුවීමේ ප්‍රගතිය මැන ගැනීම පහසුකරවීම

පරිසරය පිළිබඳ වාර්තා සකස් කිරීමට අතීතයේ දී, ජාතික මට්ටමින් දරනු ලැබූ ප්‍රයත්න වල ප්‍රතිඵලය වූයේ, 1991 දී සහ 1994 දී ශ්‍රී ලංකාව සඳහා සම්පාදනය වූ පරිසරය පිළිබඳ තත්ත්ව වාර්තාවන්ය. වනසම්පත් හා පරිසර අමාත්‍යාංශය මෙම අභ්‍යාසය සඳහා කේන්ද්‍රීය ස්ථානය වශයෙන් කටයුතු කරන අතර, ජාතික හා ජාත්‍යන්තර අවධානය යොමු විය හැකි රටේ පරිසරය පිළිබඳ නියම තත්ත්වය ඉස්මතුකොට දක්වෙන ඵලදායී ජාතික වාර්තාවක් පිළියෙල කිරීමේ වගකීම මෙම අමාත්‍යාංශය වෙත පැවරෙයි. පරිසර ක්ෂේත්‍රය තුළ ගනු ලැබූ බොහෝ මූලාරම්භ පියවරයන් හා සම්පාදනය කරනු ලැබූ විවිධ ක්‍රමෝපායයන් සැළකිල්ලට ගනිමින්, මතු වී ඇති ගැටළු සම්බන්ධයෙන් ගතයුතු ප්‍රතිකාරමය පියවරයන් ද මෙම වාර්තාව තුළින් එළිදක්වෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන (UNEP), නොරාඩ් (NORAD) ආයතනයෙන් ලද ආධාර ප්‍රදනයක් හරහා, මෙම අභ්‍යාසය නිම කිරීම සඳහා අවශ්‍ය ආධාර සපයයි. මෙම කලාපයේ ජාතික පාරිසරික වාර්තා පරිසරය පිළිබඳ කලාපීය තත්ත්ව වාර්තා සකස් කිරීමේ කායඝයෙහි දී උපකාරීවනු ඇත. වසර 2000 දී 'පරිසරය පිළිබඳ ගෝලීය තත්ත්ව වාර්තාව' සම්පාදනය කිරීම ද එක්සත් ජාතීන්ගේ ජාතික හා කලාපීය මට්ටම් වල පාරිසරික නිමැවුම් ඉවහල් කර ගනිමින් සිදු කෙරෙනු ඇත.



### ◆ පරිසර තත්ත්ව වාර්තාකරණය සඳහා වූ විශේෂිත දත්ත අවශ්‍යතාව

තිරසාර සංවර්ධනය සඳහා තීරණ ගැනීම, නිරවුල්, විශ්වාසදායක හා කාලීන තොරතුරු පදනම්කරගෙන සිදු විය යුතුය. එබැවින් පරිසර තත්ත්ව වාර්තා කරණ වැඩ පිළිවෙලට උපකාරී වන්නා වූ ශක්තිමත් තොරතුරු හා තාක්ෂණ යටිතලයක් ගොඩනැගීම ජාතියකට ඉතාම වැදගත් වෙයි. යෝජිත දත්ත මූලය පහත දක්වෙන ආකාරයට පුළුල් විෂයය කොටස් වලට වර්ග කොට සංවිධානය කරගත හැකිය.

### 1. පොදු අංශ

- ◆ ජන විකාශ විද්‍යාත්මක දත්ත (උදා: මුළු ජනගහනය, වර්ධන අනුපාතිකයන්, ජනගහන ඝණත්වය, ග්‍රාමීය නාගරික ජන සංක්‍රමණය යනාදිය)
- ◆ දිළිඳුකම සහ සමාජ සංවර්ධනයන් (උදා : දරිද්‍රතා රේඛාවෙන් පහළ ජනගහනය, සේවා නියුක්තිය, අධ්‍යාපනය, සෞඛ්‍යය යනාදිය)
- ◆ ස්වාභාවික විපත් (උදා : ගංවතුර, නියඟ, සුළි සුළං, භූ චලන, ලැව් ගිනි සහ නායයාම්)

### 2. මානව ක්‍රියාකාරකම්

- ◆ පාරිසරික සම්පත් පරිභෝජනය (භූමිය - කෘෂිකර්මය, වනසම්පත්, පතල් කැනීම, ප්‍රවාහනය, ජලය, ධීවර කර්මාන්තය, සංචාරක ව්‍යාපාරය)

### 3. පීඩාකාරී සාධක


- ◆ පස, ජලය, වාතය, සමුද්‍රය වැනි පාරිසරික මාධ්‍යයන් හි අපවිත්‍ර වීමේ /දූෂණය වීමේ මට්ටම්.
- ◆ අපවිත්‍ර කාරකයන් ගේ මූලාශ්‍ර (උදා : ලක්ෂ්‍යාකාර හෝ ලක්ෂ්‍යාකාර නොවන මූලාශ්‍ර. කර්මාන්තාශ්‍රිත මූලාශ්‍ර, ගෘහාශ්‍රිත මූලාශ්‍ර, කෘෂිකාර්මික මූලාශ්‍ර, නාගරික මූලාශ්‍ර යනාදිය)
- ◆ මානව ක්‍රියාකාරකම් ආශ්‍රිත පීඩාකාරීත්වය: අපද්‍රව්‍ය උත්පාදනය, නාගරික වර්ධනය, පරිවහනය, සාගර ඉහිරුම්)

### 4. පරිසරයෙහි අඩංගු කොටස්

- ◆ වායුගෝලයේ, ජලගෝලයේ, ශිලාගෝලයේ සහ ජෛව ගෝලයේ ජෛව, භෞතික හා රසායනික ලක්ෂණ
- ◆ ජෛව විවිධත්වය (උදා : ශාක, සත්ව, ක්ෂුද්‍ර ජීවී විවිධත්වය) පීඩාකාරීත්වය කෙරෙහි දක්වෙන්නා වූ පරිසර විද්‍යාත්මක ප්‍රතිචාරයන්
- ◆ පරිසරය තුළ සිදුවන වෙනස්වීම් (උදා : අම්ල වැසි, ගෝලීය උණුසුම්කරණය සහ ජෛව විවිධත්වය නැතිවීයාම, භූමිය/ජලය පිරිහීයාම යනාදිය)
- ◆ මානව සෞඛ්‍යයට බලපෑමේ ප්‍රතිවිපාක (උදා : මරණ සිදුවීමේ අනුපාතය භූගෝලීය ව්‍යාප්තිය යනාදිය)

### 5. සමාජීය හා කළමනාකරණමය ප්‍රතිචාරය

- ◆ ක්‍රියාකාරකම් වල ප්‍රමාණාත්මක ඇගයීම්. (උදා : ආරක්ෂාකරගත් භූමි ප්‍රමාණය, ප්‍රතිචක්‍රීය කරණය කරනු ලැබූ ප්‍රමාණය වගා කළ ප්‍රමාණය, පුනරුත්ථාපනය කරනු ලැබූ ස්ථාන, ආරක්ෂා කර ගත් සත්ව/ශාක විශේෂයන් යනාදිය.)
- ◆ ඉන්ධන සහ ජල භාවිත/පිරිමැසුම් දයකත්වය (උදා : කාර්මික නිෂ්පාදන ක්‍රියාවලිය, උපකරණ පිරිමැසුම්දයක ලෙස භාවිතා කිරීම, ප්‍රතිඋත්පාදනය කළ හැකි/ නොහැකි ඉන්ධන, මහජන ප්‍රවනතා කටයුතු, භූගත/භූමත ජල ප්‍රතිකර්ෂණයේ වෙනස්වීම් යනාදිය.)
- ◆ ආයතනික ප්‍රතිචාරයන් (උදා : නියෝග පැනවීම, පාරිසරික බලපෑම් ඇගයීම (EIA), ආර්ථික මෙවලම් (නෛතික ප්‍රතිපාදන) ජාත්‍යන්තර සම්මේලන වලට/එකඟත්වයන්ට/ගිවිසුම් වලට සම්බන්ධවීම, පාරිසරික ප්‍රමිතීන්, තාක්ෂණික නව්‍යතාවයන්, මෙහෙයුම් මධ්‍යස්ථාන, පරිසර තත්ව වාර්තා කරණය යනාදිය)
- ◆ තනි පුද්ගලයන් වශයෙන් දක්වන ප්‍රතිචාර (උදා : ප්‍රජාවගේ ආකල්ප, අගයයන් සහ ක්‍රියාමාර්ග වෙනස් කිරීම) පරිසර



තත්ත්වයන් හි සාධනීය හෝ නිශේධනීය ප්‍රවනතා අනාවරණය කර ගැනීමේ ඵලදායී පෙරහනයක් ලෙස ක්‍රියා කිරීම පිණිස පරිසර තත්ත්ව වාර්තාකරණ දත්ත මූලයන්හි විවාදයට ලක් කළ නොහැකි අන්දමේ ගුණාත්මක භාවයක් තිබිය යුතුය.

ශ්‍රී ලංකාව තුළ පරිසරයට අදාල වන්නා වූ දත්ත එක්රැස් කොට ඇත්තේ විවිධ ආයතන විසින් කොටස් වශයෙනි. එම ආයතන එසේ කර ඇත්තේ, තම තමන්ට විශේෂිත වශයෙන් ප්‍රයෝජනයක් අත්වන්නා වූ පරිසරයේ කිසියම් කොටසක් පිළිබඳව පමණක් ඇගයීමක් සිදු කරනු පිණිසය. දත්ත රැස්කිරීමේ ඔවුන්ගේ පෞද්ගලික හැකියාවන් වර්ධනය කර ගැනීම අත්‍යවශ්‍ය වන අතරම, දත්ත හුවමාරු කර ගැනීම සහ ප්‍රචාරණය පහසු කරවනු පිණිස, මෙකී ආයතන එකිනෙක අතර සබඳතා ගොඩනගා ගැනීමේ අවශ්‍යතාවක් ද පවතියි. එසේ හෙයින්, විවිධ ආයතනවල නිලධාරීන් 32 ක් සඳහා, මෙම අමාත්‍යාංශය, දත්ත රැස්කිරීම පිළිබඳ තුන් දින නේවාසික වැඩමුළුවක් 1999 ජූලි මාසයේ දී පැවැත් වූ අතර, මෙම නිලධාරීන් අවශ්‍ය දත්ත/තොරතුරු සපයාදීමෙන් අමාත්‍යාංශයට සහාය වෙයි. ඊට අමතරව මෙම අභ්‍යාසයේදී අවශ්‍ය තාක්ෂණික විශේෂඥතා ඥාණය ලබාදීමට අමාත්‍යාංශයේත්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේත් මධ්‍යම පරිසර අධිකාරියේත් නිලධාරීන්ගෙන් සැදුම්ලත් සම්බන්ධීකරණ කමිටුවක් ද පිහිටුවා ඇත.

මේ අතර, පරිසර තත්ත්ව වාර්තාකරණ අභ්‍යාස තුළින් රටට වැඩදායක වන්නා වූ ලියවිල්ලක් සම්පාදනය කිරීම අරමුණු කොටගෙන පරිසරය හා වන සම්බන්ධ ක්ෂෙත්‍ර වල නිරතව සිටින නියෝජිතයින් හට අදහස් හා යෝජනා ඉදිරිපත් කරන ලෙස මෙම අමාත්‍යාංශය ඉල්ලා ඇත. මේ හැරුනු විට, මෙම වාර්තාව නිමාවට පත් කිරීමට පෙරාතුව, එය පිළියෙල කිරීමේ අභ්‍යාසය තුළ දී විශේෂඥවරුන්ගේ මත විමසුමක් ද සිදු කෙරෙනු ඇත. මෙම අභ්‍යාසයේ සාර්ථකත්වය ප්‍රධාන වශයෙන් රඳාපවතිනු ඇත්තේ, මේ පිළිබඳ සැළකිලිමත් වන මෙරට සියළු පුරවැසියන් විසින් ලබාදෙන සහයෝගය හා උපදෙස් මත බව මේ අවස්ථාවේදී සඳහන් කිරීම වැදගත් වෙයි. එබැවින්, ඉල්ලා ඇති පරිදි ඔබගේ අදහස් හා මත ප්‍රකාශකිරීම් ඉතා වැදගත්ය. අදල විවිධ අමාත්‍යාංශ හා ආයතන විසින්, මේ සම්බන්ධයෙන් වටිනා තොරතුරු රාශියක් සපයාදීමෙන් මෙම අභ්‍යාසය උදෙසා දනටමත් ලබා දී ඇති සහාය විශිෂ්ඨ බව සටහන් කළ යුතුව ඇත.

වාර්තාව තුළින් ඉස්මතු කොට දක්විය යුතු ප්‍රශ්ණ තෝරා ගැනීම පිළිබඳව පාරිසරික ක්ෂෙත්‍රයේ නියුතු බොහෝ විද්වත්හු ද සිය අදහස් ප්‍රකාශ කොට ඇත්තාහ. වාර්තාව පිළියෙල කිරීමේ ක්‍රියාදාමය තුළ දී අත් කර ගනු ලබන ප්‍රගතිය ජනතාවට දනුම් දීමට අමාත්‍යාංශය අපේක්ෂා කරන අතර, අදළ සියළු පාර්ශවයන්ගෙන් අදහස් හා යෝජනා ලබාගැනීමට කැමැත්ත දක්වයි.

එක්රැස්කරගන්නා ලද දත්ත සම්බන්ධයෙන් සළකන විට එකී දත්ත සමුදය නිරවුල් විශ්වාසදායක සහ කාලීන තොරතුරු වලට පරිවර්තනය නොකළහොත්, එය නිෂ්ඵල දෙයක් ලෙස පවතිනු ඇතැයි නිගමනය කළ හැක. මෙම දත්ත බහුවිධ - ආංශික විශ්ලේෂණයකට භාජනය කිරීම තුළින් ජාතියේ ගැටළු හා ප්‍රශ්ණ එළිදක්වෙනු ඇත. ඒවා තවදුරටත් විශ්ලේෂණය කිරීම මගින්, පාරිසරික ප්‍රවනතාවන් කවරේදැයි නිශ්චය කරගත හැකිය. ඉන් අනතුරුව දර්ශක සකස්කරගත හැකිවන අතර, සුසංයෝජනය කරගත යුතු එම දර්ශකයන් ජාතික කලාපීය සහ ගෝලීය මට්ටම් වලින් භාවිතයට ගත හැකිය.

පරිසර තත්ත්ව වාර්තාකරණයෙහි දී, පාරිසරික දර්ශකයන්, ඇගයුමට ලක්ව ඇති පරිසර තත්ත්වයන් හි වෙනස්වීම මැනගැනීමට ඉවහල් කර ගත හැකි වැදගත් මෙවලම් වේ. ඒවා පරිසරයේ දිගුකාලීන අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට ප්‍රජාවට උපකාරී වෙයි. උදාහරණයක් වශයෙන්, පාංශු ඛාදන අනුපාතිකය, ලවණීකරණ අනුපාතිකය සහ වනාන්තර විනාශවී යාමේ අනුපාතිකය වැනි දර්ශක, භූමි පරිහානිකරණය ප්‍රමාණකරණය කර ගැනීම සඳහා භාවිතා කළ හැකිය.

මේ අනුව, මෙම අභ්‍යාසයේ අවසන් ඉලක්කය වන්නේ නිතිපතා යාවත්කාලීනකොට වාර්තා කළ යුතු දර්ශක කට්ටලයක් මත, වැඩිදියුණු කළ සහ යථාතථ්‍ය දත්ත වලින්/තොරතුරු වලින් සමන්විත පාරිසරික තොරතුරු දත්ත මූලයක් සම්පාදනය කිරීම හා යාවත්කාලීන කිරීමය.

## ◆ ජාතික පරිසර තත්ත්ව වාර්තාවේ වැදගත්කම

පරිසරයේ ඵලදායී කළමනාකරණය සඳහා ක්‍රමෝපායයන් හා වැඩසටහන් සම්පාදන කිරීමේ ක්‍රියාදාමයේ එක් ප්‍රමුඛතාවක් වන, නිරවුල් පාරිසරික දත්ත මූලයක් සැකසීම කෙරෙහි යොමු කෙරෙන සැළකිල්ල අතින් ගත් කල, ජාතික පරිසර තත්ත්ව වාර්තාව අප රටට අතිශයින් වැදගත් වෙයි. ජාතික පරිසර තත්ත්ව වාර්තාව මගින් ප්‍රමුඛතාවන් නොහොත්



ඉතා වැදගත් පාරිසරික ප්‍රශ්න පහක් පුළුල් ලෙස විග්‍රහයට ලක් කෙරෙනු ඇත. මේ සම්බන්ධයෙන් පීඩන-තත්ත්ව-බලපෑම්-ප්‍රතිචාර නම් වූ විශ්ලේෂණාත්මක රාමුවක් තුලින් අවධානය යොමු කෙරෙනු ඇත. හඳුනා ගනු ලබන වැදගත් ප්‍රශ්න වලට ක්ෂණික හා සාධනීය විසඳුම් ක්‍රියා මාර්ග අවශ්‍ය වන බැවින්, එම ප්‍රශ්න පාදක කොටගත් ක්‍රියාත්මක වැඩ සටහන් සම්පාදනය කෙරෙනු ඇත. තවද, පසු අවස්ථා වලදී අවධානය යොමු විය යුතු අඩු වැදගත්කමකින් යුතු අනිකුත් ප්‍රශ්න කෙරෙහි ද වාර්තාවෙන් අවධානය යොමු කෙරෙනු ඇත. මේ අනුව බලන කල, ජාතික පාරිසරික තත්ත්ව වාර්තාව, ජාතික පාරිසරික ක්‍රියාත්මක සැළැස්ම ක්‍රියාවට නැංවීමේ කටයුතු වලට සහාය වන හෝ එම කටයුතු වර්ධනය කෙරෙන මෙවලමක් ලෙස සැළකිය හැකිය.


මධ්‍යම පරිසර අධිකාරිය යටතේ සිදුවන එක් ක්‍රියාකාරකමක් වශයෙන්, ප්‍රාදේශීය මට්ටමින් පාරිසරික පැතිකඩ සටහන් පිළියෙල කිරීම දනට සිදුවෙමින් පවතියි. මෙම අභ්‍යාසය ප්‍රාදේශීය ලේකම්වරුන් මගින්, පාරිසරික සංවර්ධන හවුල්කාර ආයතන වල සහාය ඇතිව ක්‍රියාවේ යෙදවෙයි. මෙම පැතිකඩ සටහන් මගින් අදාල ප්‍රදේශ වල පවතින පාරිසරික ප්‍රශ්න ඉස්මතු කොට දක්වමින් අදාල ගැටළු සමනය කොට එලදයී අන්දමින් පරිසරය කළමනාකරණය කිරීම සඳහා වන යෝජනා ඉදිරිපත් කෙරෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. ප්‍රාදේශීය ප්‍රශ්න කෙරෙහි කිසියම් අවධානයක් යොමු කළ හැකිවන පරිදි, පරිසර තත්ත්ව වාර්තාව සකස් කිරීමේ දී පාරිසරික පැතිකඩ සටහන් පිළිබඳ තොරතුරු භාවිතයට ගැනීමට අදහස් කෙරේ.

රටේ සංවර්ධන ප්‍රවනතාවන් අඩපණ කිරීමට පවා හේතුකාරක විය හැකි රට මුහුණ පාන ප්‍රශ්න කෙරෙහි අවධානය යොමු කිරීමට, ප්‍රතිපත්ති සම්පාදකයන්ටත්, රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නවුන්ටත්, සමස්තයක් වශයෙන් පොදු මහජනයාටත්, මෙමගින් අවස්ථාවක් ලබාදෙනු ඇත. එමෙන්ම එය ජාත්‍යන්තර ප්‍රජාවට ජාතික පරිසරයේ කිසියම් අපේක්ෂා සහගත ස්වරූපයක් පෙන්නුම් කිරීමට සහ එතුලින් මෙම ප්‍රශ්න ක්‍රමවත් අයුරින් නිරාකරණය කර ගැනීමෙහිලා ඔවුන්ගෙන් කිසියම් සහයෝගයක් ලබාගැනීමටත් ඉවහල් වනු ඇත.

අප නව සහස්‍රයට ප්‍රවිෂ්ඨ වීමත් සමඟ අපගේ අනාගතය සම්බන්ධයෙන් කටයුතු කිරීමේ අවශ්‍යතාව තවදුරටත් තීව්‍ර වන බව පෙනී යයි. තිරසාර සංවර්ධනය සඳහා වන ජාතික කැපවීම සම්බන්ධයෙන් සහතික වනු පිණිස, පරිසරය කළමනාකරණය කිරීමේ වැඩ පිළිවෙලට නායකත්වය අමාත්‍යාංශය වෙත පැවරී ඇති බැවින් එලදයී පරිසර තත්ත්ව වාර්තාවක් පිළියෙල කිරීම තුලින් අනාගත පරම්පරාවන් සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කර දීමට අවශ්‍ය පදනම හා උරුමය අපට ලබාදෙනු ඇත.

ජාතික වශයෙන් වැදගත් වූ මෙම අභ්‍යාසය පිළිබඳව ඔබගේ වටිනා අදහස් හා යෝජනා ලබාගැනීමට මෙම අමාත්‍යාංශය ඉමහත් උනන්දුවක් දක්වයි. මෙම අභ්‍යාසය තුල දී ආවරණය විය යුතු අංශ පිළිබඳවත් මෙම වාර්තාව තුළින් ඉස්මතුකොට දැක්විය යුතු ප්‍රමුඛතාව ලබාදීම අවශ්‍ය කෙරෙන ප්‍රශ්න පිළිබඳවත්, මෙම අභ්‍යාසයේ සඵලත්වයට ඉවහල් විය හැකි වෙනයම් වැදගත් අංශ පිළිබඳවත්, ඔබගේ මත හා අදහස් දන්වා එවීමෙන්, මෙම අභ්‍යාසයට සහභාගීවන ලෙස පරිසර ක්ෂේත්‍රයේ හා ඒ හා සම්බන්ධ කටයුතු වල නියැලි සියළුම විශේෂඥයන්ට සහ පොදු මහජනයාට කාරුණිකව ඇරයුම් කෙරේ.

**එන්. පත්මනාදන්**
**ලේකම්**
***වන සම්පත් හා පරිසර අමාත්‍යාංශය***



"දිය දහරක අභිමානය" - දියළුම ඇල්ල.

